RARE

# ගුරු සිසු සන්නිවේදනයේ පවතින ගැටලු සංවර්ධනාත්මක අධ්‍යාපන ක්‍රියාවලිය කෙරෙහි සිදු කරන බලපෑම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

(වයඹ පළාතට සුවිශේෂීව)

ජී.ඒ.සී.පී. රත්නවර්ධන

FDS/MACO/MC/08/012

සමාජ විද්‍යාපති ජන සන්නිවේදන උපාධියෙහි අවශ්‍යතාවයක් පූරණය කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන නිබන්ධයකි.



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1269 |
| වර්ග අංකය: | |



මාර්තු 2015

# Impact of Weak Teacher Student Communication to the Development Education Process: A Research Based on (North Western Province)

G.A.C.P Rathnawardana[1] and Prof.R.L Piyadasa[1]
1 University of Kelaniya, Kelaniya

**Abstract**

There are several arising problems in education which can identify commonly. It was found that there is no proper mechanism to develop formal teacher-student communication. This research was conducted to find out the impact of weak teacher-student communication to the development education process. Twenty Five teachers from 5 schools in North Western province were selected as the sample using stratified sampling technique. Face to face to interviews, Semi structured questionnaires and observation techniques were used to collect data. After analyzing collected data it was found that, to conduct proper communication within the class room in learning and teaching process teacher should have powerful language proficiency. It is important to use learning aids and teacher should have positive attitude towards the students. Most of the teachers use viable communication as their main teaching aid. Other than that Subject oriented education process presented today causes some problems for both teachers and students. Majority of the teachers do not have any special training on communication and they do not have proper knowledge about communication.

Keywords: Teaching and learning process, Communication, Teacher, Student, Education

# ගුරු සිසු සන්නිවේදනයේ පවතින ගැටලු සංවර්ධනාත්මක අධ්‍යාපන ක්‍රියාවලිය කෙරෙහි සිදු කෙරෙන බලපෑම පිළිබඳව පර්යේෂණාත්මක අධ්‍යයනයක්
# (වයඹ පළාතට සුවිශේෂීව)

ජී. ඒ. සී. පී. රත්නවර්ධන,
මහාචාර්ය ආර්. එල්. පියදාස,
කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## සාරාංශය

වර්තමාන ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංකීර්ණ අධ්‍යාපන ක්‍රියාවලිය තුළ විධිමත් ගුරු සිසු සන්නිවේදන ක්‍රමයක් භාවිත නොකිරීම හේතුවෙන් ගැටලු රැසක් උද්ගත වී ඇති බව අනාවරණය විය. එහෙයින් ගුරු සිසු සන්නිවේදනයේ පවතින ගැටලු අවම කරලීමේ අරමුණින් ''ගුරු සිසු සන්නිවේදනයේ පවතින ගැටලු සංවර්ධනාත්මක අධ්‍යාපන ක්‍රියාවලිය කෙරෙහි සිදුකරන බලපෑම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්'' සිදු කළෙමි. ඒ සඳහා අධ්‍යයන නියැදිය වශයෙන් වයඹ පළාතේ පාසල් 05 ක් තෝරා ගනු ලැබූ අතර, නියැදියේ තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, සහභාගීත්ව නිරීක්ෂණය, නිරීක්ෂණය යන පර්යේෂණ උපක්‍රම භාවිත කළෙමි. ඉහත පර්යේෂණ ක්‍රම මගින් සපයා ගත් දත්ත ඇසුරින් කළ විශ්ලේෂණයේ දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පන්ති කාමරය තුළ ගුරුවරයාට මනා සන්නිවේදනයක් පවත්වා ගැනීමට ප්‍රබල භාෂාත්මක තත්ත්වයක් තිබිය යුතු බවත්, ඉගෙනුම් ආධාරක උපයෝගී කරගත යුතු බවත් ශිෂ්‍යයන් කෙරෙහි ගුරුවරයා ධනාත්මක ආකල්පයකින් සහිත විය යුතු බවත් පවතින අධ්‍යාපනය විෂය මූලික වීමෙන් ගුරුවරයාට මෙන්ම ශිෂ්‍යයාට ද එය ගැටලු මතු කරන බවත් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැඩි වශයෙන් ගුරුවරුන් වාචික සංකේත භාවිත කරන බවත් ගුරුවරුන් වැඩි ප්‍රතිශතයක් සන්නිවේදනය පිළිබඳ සෘජු දැනීමක් හෝ ඒ සම්බන්ධ හැදෑරීමක් සිදු කර නොමැති බවත් අනාවරණය විය.

මූල පද : ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, සන්නිවේදනය, ගුරුවරයා, ශිෂ්‍යයා, අධ්‍යාපනය.